මානව සම්පත් අභිවර්ධන ආයතනය

කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

ශ්‍රම අධ්‍යාපනවේදී ඩිප්ලෝමා පාඨමාලාව - 2022/23

(දෙවන සෙමෙස්තරය)

(පවත්වන ලද්දේ 2023 මැයි)

# DY 05 - දේශපාලන විද්‍යාව

**අයදුම්කරුවන්ට උපදෙස් :**

(1) ප්‍රශ්න හතරකට (04) පිළිතුරු ලියන්න.

(2) මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න හයකින් (06) සහ පිටු එකකින් (01) සමන්විත වේ.

(3) කාලය පැය තුනයි. (03)

(4) පිළිතුරු පත්‍රයේ සියලුම පිටුවල විභාග අංකය යොදන්න.

(5) ප්‍රශ්න පත්‍රයේ යම පිටුවක් හෝ කොටසක් පැහැදිලිව මුද්‍රණයවී නොතිබේ නම් කරුණාකර වහාම ඒ බව ශාලාධිපතිට දැනුම් දෙන්න.

01. I. යටත් විජිතභාවයෙන් නිදහස්වීම පිළිබඳ ඉල්ලීම හා 1947 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා වර්ධනයේ පසුබිම සාකච්ඡා කරන්න.

II. 1947 සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලිකාංග පහදන්න.

(මුළු ලකුණු 25)

02. 1950 සහ 60 දශක වල ශ්‍රී ලංකාවේ බෞද්ධ ඉල්ලීම් වල ස්වභාවය විවේචනාත්මකව විමසන්න.

(මුළු ලකුණු 25 )

03. නිදහසින් පසු සුළු ජාතික මැයිවිලි ව්‍යාපාරය සන්නද්ධ ක්‍රියාවලියක් දක්වා වර්ධනය වී ගිය ආකාරය විග්‍රහ කරන්න.

(මුළු ලකුණු 25)

04. I. 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට පසුබිම්ව ස්වදේශ ජනිත ව්‍යවස්ථාවක් පිළිබඳ අදහස වර්ධනය වූයේ කෙසේද?

II. 1972 ජනරජ ව්‍යවස්ථාවේ නවාංග පැහැදිලි කරන්න.

(මුළු ලකුණු 25)

05. I. ශ්‍රී ලංකාවේ ජනාධිපති ආණ්ඩුක්‍රමයක් පිළිබඳ අදහස වර්ධනය වූයේ කෙසේද?
II. 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ජනාධිපතිවරයාගේ බල පරාසය විවේචනාත්මකව විමසන්න.

(මුළු ලකුණු 25)

06. ශ්‍රී ලංකාවේ දේශපාලන පක්ෂ ක්‍රමයේ නව ප්‍රවණතා විශ්ලේෂණාත්මකව විභාග කරන්න.

(මුළු ලකුණු 25)

******

IHRA
UNIVERSITY OF COLOMBO

මානව සම්පත් අභිවර්ධන ආයතනය

කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

ශ්‍රම අධ්‍යාපනවේදී ඩිප්ලෝමා පාඨමාලාව - 2022/23

(දෙවන සෙමෙස්තරය)

(පවත්වන ලද්දේ 2023 මැයි)

# DY 05 - ව්‍යාපාර පරිසරය

අයදුම්කරුවන්ට උපදෙස් :

(1) ප්‍රශ්න පහකට (05) පිළිතුරු ලියන්න.

(2) මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න හතකින් (07) සහ පිටු දෙකකින් (02) සමන්විත වේ.

(3) කාලය පැය තුනයි. (03)

(4) පිළිතුරු පත්‍රයේ සියලුම පිටුවල විභාග අංකය යොදන්න.

(5) ප්‍රශ්න පත්‍රයේ යම් පිටුවක් හෝ කොටසක් පැහැදිලිව මුද්‍රණයවී නොතිබේ නම් කරුණාකර වහාම ඒ බව ශාලාධිපතිට දැනුම දෙන්න.

01. i. "ව්‍යාපාර පරිසරය" යන්නෙන් ඔබ කුමක් අදහස් කරන්නේ දැයි පැහැදිලි කරන්න.

(ලකුණු 10)

ii. "ව්‍යාපාර පරිසරය" යන්නට ඇතුළත් වන අදාළ කොටස් පැහැදිලි කරන්න.

(ලකුණු 10)

(මුළු ලකුණු 20)

02. i. "ගෝලීයකරණය" මගින් දියුණු වෙමින් පවතින රටවල ව්‍යාපාර පරිසරයට එල්ලවන බලපෑම් මොනවාද?

(ලකුණු 10)

ii. ගෝලීයකරණයේ හිතකර ස්වභාවයන් ඔබ හඳුනාගන්නේ කෙසේද?

(ලකුණු 10)

(මුළු ලකුණු 20)

03. i. ව්‍යාපාර පරිසරයේදී සම්මුතිය (Negotiation) සඳහා ඇති වැදගත්කම පැහැදිලි කරන්න.

(ලකුණු 10)

ii. සම්මුතිය (Negotiation) එදිනෙදා ජීවිතයේදී ඔබට කෙතරම් වැදගත්ද?

(ලකුණු 10)

(මුළු ලකුණු 20)

04. i. මහජන සම්බන්ධතා කළමනාකරණය (Public Relationship Management) ව්‍යාපාර පරිසරය කෙරෙහි අදාළ වන්නේ කෙසේද?

(ලකුණු 10)

ii. ව්‍යාපාරයක් සම්බන්ධයෙන් සම්පත් මෙහෙයවීම හා සම්බන්ධීකරණ ක්‍රියාවලියේ (Logistics) වැදගත්කම පැහැදිලි කරන්න.

(ලකුණු 10)

(මුළු ලකුණු 20)

05. i. ව්‍යාපාර ලෝකයේ සාර්ථකත්වය කෙරෙහි වඩා වැදගත් වන්නේ ව්‍යවසායකයාද, ව්‍යාපාරිකයාද යන්න පැහැදිලි කරන්න.

(ලකුණු 10)

ii. රක්ෂණ සංකල්පය මත පරිමාණුකූල ව්‍යාපාර බිහිවීම කෙරෙහි දක්වන දායකත්වය කෙබඳුද?

(ලකුණු 10)

(මුළු ලකුණු 20)

06. i. සංනිවේදනය හා ඵලදායී සංනිවේදනය අතර ඔබ හඳුනාගන්නා වෙනස කුමක්ද?

(ලකුණු 10)

ii. "නිර්මාණාත්මකභාවය ව්‍යාපාර පරිසරයට නැවුම්බවක් එක්කරයි". පැහැදිලි කරන්න.

(ලකුණු 10)

(මුළු ලකුණු 20)

07. කෙටි සටහන් ලියන්න.

i. ආයතනයේ ප්‍රතිරූපය (Cooperate Image)
ii. කෘතිම බුද්ධිය (Artificial Intelligent)
iii. උපරිම තොගය හා අවම තොගය (Maximum Stock and Minimum Stock)
iv. ගෙවුම් ශේෂ ලේඛනය (Balance of Payment)

(5*4 = 20)

*****

මානව සම්පත් අභිවර්ධන ආයතනය

කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

ශ්‍රම අධ්‍යාපනවේදී ඩිප්ලෝමා පාඨමාලාව - 2022/23

(දෙවන සෙමෙස්තරය)

(පවත්වන ලද්දේ 2023 මැයි)

# DY 06 - විද්‍යාව හා තාක්ෂණය

**අයදුම්කරුවන්ට උපදෙස් :**

(1) ප්‍රශ්න සියල්ලටම පිළිතුරු ලියන්න.

(2) මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න පහකින් (05) සහ පිටු හතරකින් (04) සමන්විත වේ.

(3) කාලය පැය තුනයි. (03)

(4) පිළිතුරු පත්‍රයේ සියලුම පිටුවල විභාග අංකය යොදන්න.

(5) ප්‍රශ්න පත්‍රයේ යම් පිටුවක් හෝ කොටසක් පැහැදිලිව මුද්‍රණයවී නොතිබේ නම් කරුණාකර වහාම ඒ බව ශාලාධිපතිට දැනුම් දෙන්න.

1)

a. පහත මාතෘකා වලින් අදහස් කරන්නේ කුමක්ද යන්න පැහැදිලි කරන්න.

i විද්‍යාව

ii තාක්ෂණය

(ලකුණු 2 x 2)

b. විද්‍යාවට අනුව පහත දක්වා ඇති පද වලින් අදහස් කරන්නේ කුමක්ද යන්න කෙටියෙන් පැහැදිලි කරන්න.

i නීතිය (නියමය)

ii කල්පිතය

iii න්‍යාය

(ලකුණු 2 x 3)

c. සන්නායක යනු විභව වෙනසක් යෙදීමෙන් ඉලෙක්ට්‍රෝන එක් ස්ථානයක සිට තවත් ස්ථානයකට ගෙනයාමට භාවිතා කරන ද්‍රව්‍ය වේ. විද්‍යුත් වශයෙන් පදාර්ථය බෙදා දැක්විය හැකි අනෙකුත් ආකාර මොනවද ? ඒ සඳහා උදාහරණ දෙක බැගින් දක්වන්න.

(ලකුණු 1 x 2)

d. සන්නායකයක් තුලින් විභව අන්තරයක් යටතේ ධාරාව ගමන් කරන ආකාරය පැහැදිලි කරන්න.

(ලකුණු 4)

e. සරල විද්‍යුත් ධාරාවක ඉලෙක්ට්‍රෝන ප්‍රවාහය ගමන් කරන දිශාව අනුව සම්මුතීන් දෙකකට බෙදා දැක්විය හැකිය. රූප සටහනක් ආධාරයෙන් මෙම සම්මුතීන් විස්තර කර දක්වන්න.

(ලකුණු 2 x 2)

2)

a. යම් වස්තුවක් චලනය වීමට අදාලව එහි වේගය, ප්‍රවේගය හා ත්වරණය අර්ථ දක්වන්න.

(ලකුණු 3)

b. මෝටර් රථයක් සෘජු තිරස් මාර්ගයක පිහිටා ඇති මාර්ග සංඥා පුවරු දෙකක් අතර ගමන් කිරීමට 120 s කාලයක් ගත කරයි. සංඥා පුවරු දෙකක් අතර දුර 2145 m වේ. මෝටර් රථය නිශ්චල තත්වයෙන් පටන්ගෙන තත්පර 30 කට පසු 22 m s -1 ප්‍රවේගයක් අත් කර ගනී. මෝටර් රථය T කාලයක් ඉහත ප්‍රවේගයෙන් ගමන් කරයි. ඉන්පසු මෝටර් රථය ඒකාකාර මන්දනයෙන් ගමන් කර දෙවන මාර්ග සංඥා පුවරුව අසල නවතී.

i. මෝටර් රථයේ ගමන විස්තර කිරීම සඳහා ප්‍රවේග කාල ප්‍රස්ථාරයක් ඇඳ දක්වන්න. ( T ඇසුරෙන් කාලය දක්වන්න)

(ලකුණු 5)

ii. T හි අගය ගණනය කරන්න.

(ලකුණු 5)

c. රූපයේ ආකාරයට සුමට මේසයක් මත සකන්ධය M1 (2 kg) සහ M2 (5 kg) වන වස්තූන් දෙකක් තබා තන්තුවකින් එකිනෙක සම්බන්ධකර ඇත. M1 මත 4 N බලයක් හා M2 මත 12 N බලයක් යෙදේ නම්, මෙම පද්ධතිය ගමන් කරන දිශාව හා ත්වරණය ගණනය කරන්න.

(ලකුණු 4)

d. වාහනයක ගමන් කිරීමේදී ආසන පටි පැලැන්දීමෙන් ජීවිත අනතුරු අවම කරගත හැකි ආකාරය නිව්ටන්ගේ තුන්වන නියමය (Newtons 3rd low) ආධාරයෙන් සැකෙවින් පැහැදිලි කරන්න.

(ලකුණු 3)


3).

a. ඉලෙක්ට්‍රොනික විද්‍යාවේ භාවිතා වන ප්‍රතිසම (Analog) හා සංඛ්‍යාංක (Digital ) සංඥා අතර වෙනස පැහැදිලි කර එම සංඥා සඳහා උදාහරණ දෙකක් ප්‍රස්ථාරිකව නිරූපනය කරන්න.

(ලකුණු 4)

b. පහත දක්වා ඇති පරිපත සටහනේ A හා C අතර සමක ප්‍රතිරෝධය (Equivalent Resistance) ගණනය කරන්න.

(ලකුණු 8)





c. ඕම්ස් ගේ නියමය ( Ohms Law) පැහැදිලි කර එයට අදාල සමීකරණය ලියා දක්වන්න.

(ලකුණු 3)

d. නිවසක විදුලි බුබුළු පරිපථයක සරල සටහනක් පහත දක්වා ඇත. මෙම පරිපථය තුලින් ගලන මුළු ධාරාව (I ) කොපමණ ද ?

(ලකුණු 5)




4).

a. අප වටා ඇති වායු ගෝලය අධ්‍යනය කිරීමෙ පහසුව සඳහා උප ගෝල කිහිපයකට බෙදා දක්වා ඇත.

i. මෙම බෙදා දැක්වීම සිදුකර ඇත්තේ කුමන පදනමක් යටතේද ?

(ලකුණු 2)

ii. වායු ගෝලය සමන්විත වන උපගෝල පහ මොනවාදැයි නම් කරන්න.

(ලකුණු 5)

b. හරිතාගාර ආවරණය (green house effect ) පෘථිවියෙහි ජීවයේ පැවැත්මට ඉතා වැදගත් කාර්යයක් සිදුකරයි. හරිතාගාර ආවරණ ක්‍රියාවලිය පැහැදිලි කර එය ජීවයේ පැවැත්මට දායක වන ආකාරය පැහැදිලි කරන්න.

(ලකුණු 5)

c. ඕසෝන් ස්තරය මගින් UV කිරණ අවශෝෂණය කරගන්නා ආකාරය පැහැදිලි කර ඕසෝන් ස්තරය ක්ෂය වීම නිසා ඇති වන බලපෑම තුනක් සඳහන් කරන්න.

(ලකුණු 6)

e. හරිතාගාර ආවරණය ස්වාභවික සන්සිධියක් වුවද, මිනිස් ක්‍රියාකාරකම් නිසා මෙ මගින් ගෝලීය උණුසුම ඉහල යාමට ඉවහල් වේ. මෙය පහදා දෙන්න.

(ලකුණු 2)

5).

a. ජල දූෂණය යනු මිනිසාගේ පැවැත්මට සෘජුවම බලපාන කාරණාවකි. බොහෝවිට ජලය දූෂණය වීම මිනිස් ක්‍රියාකාරකම් නිසා සිදු වුවද, ස්වභාවිකව සිදුවන පරිසර ක්‍රියාකරකම් නිසාද ජලය දූෂණය වේ.

i. ජල දූෂණය යනුවෙන් අර්ථ දක්වන්නේ කුමක්දැයි හඳුන්වාදී ප්‍රධාන වශයෙන් ජලය දූෂණය වන ආකාර දෙක විග්‍රහ කරන්න.

(ලකුණු 4)

ii. ජල දූෂණයට හේතුවන සාධක තුනක් නමකර එම සාධක මගින් ජලය දූෂණය වන ආකාරය පිළිබඳ කෙටි සටහන් ලියන්න.

(ලකුණු 6)

b. අපද්‍රව්‍ය කළමනාකරණය යනු වැඩිවන පරිසර දූෂණය සහ සම්පත් ක්ෂයවීයාම වැනි කාරණා නිසා මිනිසාට ඉතා වැදගත් අංගයකි.

i. අපද්‍රව්‍ය කළමනාකරණය යනුවෙන් සරලව අර්ථ දක්වන්නේ කුමක් ද ?

(ලකුණු 4)

ii. අපද්‍රව්‍ය කළමනාකරණයේ විධික්‍රම තුනක් සඳහන් කර ඒවා පැහැදිලි කරන්න.

(ලකුණු 6)

******

මානව සම්පත් අභිවර්ධන ආයතනය

කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

ශ්‍රම අධ්‍යාපනවේදී ඩිප්ලෝමා පාඨමාලාව - 2022/23

(දෙවන සෙමෙස්තරය)

(පවත්වන ලද්දේ 2023 මැයි)

# DY 08 - ශ්‍රම අධ්‍යන මූලධර්ම

**අයදුම්කරුවන්ට උපදෙස් :**

(1) ප්‍රශ්න පහකට (05) පිළිතුරු ලියන්න.

(2) මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න හතකින් (07) සහ පිටු දෙකකින් (02) සමන්විත වේ.

(3) කාලය පැය තුනයි. (03)

(4) පිළිතුරු පත්‍රයේ සියලුම පිටුවල විභාග අංකය යොදන්න.

(5) ප්‍රශ්න පත්‍රයේ යම් පිටුවක් හෝ කොටසක් පැහැදිලිව මුද්‍රණයවී නොතිබේ නම් කරුණාකර වහාම ඒ බව ශාලාධිපතිට දැනුම් දෙන්න.

1. (අ) ශ්‍රම බලකායක දක්නට හැකි ප්‍රභේද දක්වන්න.

(ලකුණු 06)

(ආ) ශ්‍රම බලකාය ගුණාගුණාත්මකව වර්ධනය කිරීම හා ඵලදායීතාවය වැඩි කිරීම සඳහා ගතහැකි ක්‍රියාමාර්ග පැහැදිලි කරන්න.

(ලකුණු 14)

2. (අ) "ශ්‍රම වෙළඳපොල ක්‍රියාකාරීත්වය ගැන සැලකීමේදී ශ්‍රමය නිෂ්පාදන සාධකයක් ලෙස සැලකුවද, එය අනිකුත් නිෂ්පාදන සාධක වලට වඩා වෙනස්වේ." ශ්‍රමයෙහි දක්නට ඇති විශේෂ ලක්ෂණ සඳහන් කරමින් ඉහත ප්‍රකාශය පැහැදිලි කරන්න.

(ලකුණු 10)

(ආ) "ශ්‍රමයෙහි ඇති සුවිශේෂ ලක්ෂණයන් නිසා, ශ්‍රමය විකුණන ශ්‍රමිකයන්, එය විකිණීමට ප්‍රථම සිය විවිධ අවශ්‍යතා පිළිබඳව අවධානය යොමු කරයි." ශ්‍රමිකයා, ශ්‍රම වෙළඳපොල තුල හැසිරෙන අයුරු සඳහන් කර ඉහත කරුණු පැහැදිලි කරන්න.

(ලකුණු 10)

3. (අ) ශ්‍රී ලංකාවේ දැනට ක්‍රියාත්මක වන වේතන වල ප්‍රභේද දක්වන්න.

(ලකුණු 06)

(ආ) ශ්‍රමිකයන්ගේ ඵලදායීතාව වර්ධනය කර නිෂ්පාදනය වැඩි කිරීම සඳහා සේව්‍යයන් විසින් වේතනයට අමතරව ගන්නා දීමනාවල වාසි සහ අවාසි කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 14)

4. ශ්‍රීලංකාවේ ශ්‍රම බලකා සහභාගීත්ව අනුපාතයන් පහතින් දක්වා ඇත. (2022 පළමු කාර්තුව)
ශ්‍රම බලකා සහභාගීත්ව අනුපාතය - 51.2%
පුරුෂ සහභාගීත්ව අනුපාතය - 71.8%
කාන්තා සහභාගීත්ව අනුපාතය - 33.6%
ශ්‍රම බලකායට අයත් ජන සංඛ්‍යාව - මිලි:17.104 (ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව)

ඉහත සංඛ්‍යා ලේඛන අනුව පෙනී යන්නේ වෙනත් සංවර්ධිත රටවල් හා සැසඳීමේදී කාන්තා ශ්‍රම සහභාගීත්වය ඉතා අවම මට්ටමක පවතින බවයි. මෙම තත්ත්වයට හේතුවන කරුණු පැහැදිලි කර, කාන්තා ශ්‍රම සහභාගීත්වය වැඩිදියුණු කරලීමට අවශ්‍ය යෝජනා ඉදිරිපත් කරන්න.

(ලකුණු 20)

5. (අ) "1950 අංක 43 කාර්මික ආරවුල් පනත මගින් සේවකයාගේ රැකියා සුරක්ෂිතභාවය තහවුරු කරයි." කාර්මික ආරවුල් පනතේ සේවක රැකියා සුරක්ෂිතභාවය තහවුරු කිරීම සඳහා යොදා ඇති ප්‍රතිපාදන සඳහන් කරන්න.

(ලකුණු 08)

(ආ) ඉහත ප්‍රතිපාදන අතුරින් දෙකක් පිළිබඳව කාර්මික ආරවුල් පනතේ දක්වා ඇති විධිවිධාන ඇසුරෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 12)

6. (අ) වෘත්තීය සමිතියක ප්‍රධාන පරමාර්ථ කවරේද?

(ලකුණු 05)

(ආ) " ශ්‍රී ලංකාවේ වෘත්තීය සමිති ව්‍යාපාරයේ අපූර්ව සිද්ධියක් වන්නේ මෙම ව්‍යාපාරය කම්කරුවන් අතරින් නොව ඊට පරිබාහිරවූ බටහිර රටවල අධ්‍යාපන ලැබූ මධ්‍යම පංතිකයන්ගේ නායකත්වයෙන් ආරම්භ වීමය. මෙම තත්ත්වය දිගටම පැවතුනු අතර, පසුකාලීනව දේශපාලන නායකයින්ද මෙයට නායකත්වය දුන්හ."

ඉහත කියමන සැලකිල්ලට ගනිමින් ශ්‍රී ලංකාවේ වෘත්තීය සමිති ව්‍යාපාරයේ වර්ථමාන තත්ත්වය සම්බන්ධව විචාරාත්මක ඇගයීමක් කරන්න.

(ලකුණු 15)

7. 1954 අංක 19 දරණ සාප්පු හා කාර්යයාලීය සේවකයින් පිළිබඳ (සේවය හා වේතන විධිමත් කිරීමේ) පනත මගින් සේවකයින්ගේ සේවය හා වේතන විධිමත් කිරීම සඳහා දක්වා ඇති නීතිමය තත්ත්වය පැහැදිලි කර ඉන් ශ්‍රමිකයාට ලැබෙන ප්‍රතිලාභ පිළිබඳව පැහැදිලි කරන්න.

(ලකුණු 20)

8. පහත සඳහන් මාතෘකා හතරක් (04) පිළිබඳව කෙටි සටහන් ලියන්න.
   (අ) වේතන පිළිබඳ සංකල්ප
   (ආ) 1983 අංක 12 දරණ පාරිතෝෂිත ගෙවීම පනත
   (ඇ) සාමූහික කේවල් කිරීම ()
   (ඈ) 1958 අංක 15 දරණ සේවක අර්ථසාධක අරමුදල් පනත.
   (ඉ) ශ්‍රමය සඳහා දිගුකාලීන ඉල්ලුම ()

(ලකුණු 05*4 = 20)

*******